**Alliance Finance Co. PLC**

Since 1956

Making the world a better place through sustainable finance

# අරමුණු ප්‍රකාශය

## “තිරසාර මූල්‍යකරණය තුළින් වඩාත් හිතකර ලොවක්”

## ප්‍රධාන කරුණු පිළිබඳ ලේඛනය

## ස්ථාවර තැන්පතු, ඉතුරුම් ගිණුම් සහ ක්ෂණික මූල්‍ය ණය පහසුකම්

afc

PEOPLE • PLANET • PROFIT

Sri Lanka's pioneering triple bottom line financial institution

# හැඳින්වීම

එලායන්ස් ෆිනෑන්ස් පීඑල්සී (AFC) යනු කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර ඇති සහ 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති සමාගමකි. 1956 දී පිහිටුවන ලද මෙය, ශ්‍රී ලංකාවේ පැරණිතම මූල්‍ය සමාගම වීම ගැන අපි මහත් සේ ආඩම්බර වෙමු. දශක හයකට වැඩි කාලයක් පුරා පරම්පරා හතරක අපි කෙරෙහි විශ්වාසය තැබූ විශ්වාසවන්ත ගනුදෙනුකරුවන්ට පුළුල් පරාසයක මූල්‍ය සේවා රැසක් සැපයීමෙන් අපි වර්ධනය වී ඇත්තෙමු.

අපගේ සමාගම ස්ථාවර තැන්පතු, ඉතිරිකිරීමේ ගිණුම්, ක්ෂණික ණය පහසුකම්, ලීසිං, ණය, රන් ණය, රන් ආයෝජන, දේශගුණික මූල්‍ය, දේපළ වෙළඳාම්, ඔටෝ වෙළඳාම්, සහයෝගීතා මූල්‍ය, ආනයන / වෙළඳ මූල්‍ය, ඇපකර නිකුත් කිරීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ව්‍යාපෘති මූල්‍යකරණය, කොටස් කළඹ කළමනාකරණය, ලීසිං මෙහෙයවීම්, Ezy ඩ්‍රයිව් (වාහන කුලියට ගැනීම), ස්වයංක්‍රීය-සුරක්ෂිත - ප්‍රවාහන විසඳුම් සහ අපගේ දිවයින පුරා ශාඛා ජාලය හරහා සංවිධානය කරන ලද අනෙකුත් සහායක සේවාවන් ඇතුළු පුළුල් පරාසයක මූල්‍ය සේවාවන් සැපයීමේ නිරත වේ.

වසර හැටපහකට අධික වර්ධන කාලය තුළ, පාරිභෝගික තෘප්තිය අපගේ මූලික අරමුණ වී ඇති අතර, ඔබට උපරිම උසස් සේවාවක් ලබා දීම අපගේ ශ්‍රම බලකායේ අරමුණයි.

අපගේ කාර්යාලයට පැමිණ සතියේ දිනවල පෙ.ව. 8.00 සිට ප.ව. 4.30 දක්වා මෙන්ම සෙනසුරාදා දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 1.00 දක්වා අපගේ කැපවූ කාර්ය මණ්ඩලයේ අසමසම කඩිනම්, මිත්‍රශීලී සහ පුද්ගලාරෝපිත සේවාව අත්විඳින ලෙස අපි ඔබට ආරාධනා කරන්නෙමු. ඔබගේ අවශ්‍යතාවය අනුව අපගේ වටිනා තැන්පතු හිමියන් සඳහා ඵලදායී සේවාවක් ඔබගේ දොරකඩටම පැමිණ අපි සපයන්නෙමු. මෙම අවස්ථා ඔබට වඩා හොඳින් සේවය කිරීමට අවස්ථාවක් ලබා දෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

ISO 9001:2015, ISO 22301:2012, ප්‍රමිති සහතික ලත් ආයතනයක් වන අතර Lanka Rating Agency විසින් [SL] BBB$^{-}$ with stable outlook ණය ශ්‍රේණිගත කිරීම ලබා දී ඇත.

PEOPLE • PLANET • PROFIT

Sri Lanka's pioneering triple bottom line financial institution

# ප්‍රධාන කරුණු - ස්ථාවර තැන්පතු

| නිෂ්පාදනය | නිෂ්පාදනයේ ප්‍රධාන ලක්ෂණ, ප්‍රතිලාභ සහ ස්වභාවය. | අවශ්‍ය ලියකියවිලි. | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි | අදාළ පොලී අනුපාතය/දඩ /ගාස්තු |
|---|---|---|---|---|
| **ස්ථාවර තැන්පතුවක් විවෘත කිරීම** | 1. 2005 අංක 1 දරන මූල්‍ය සමාගම් පනතේ (තැන්පතු) උපදෙස් අනුව තැන්පතු ලබාගනී.<br>2. තැන්පතු තනි තනිව හෝ බද්ධව කළ හැකිය.<br>3. අවම තැන්පතුව - රු. 5,000/-<br>4. කාලසීමාව - මාස 1 සිට මාස 60 දක්වා<br>5. මාසිකව, කාර්තුමය වශයෙන්, ද්විවාර්ෂිකව, වාර්ෂිකව හෝ කල්පිරීමේදී පොළිය ගෙවීම.<br>6. පාරිභෝගිකයන්ගේ අභිමතය පරිදි නාමිකයින් ලබා දිය හැකිය.<br>7. පාරිභෝගික ඉල්ලීම පරිදි ස්ථාවර තැන්පතු සඳහා පොළිය ස්වයංක්‍රීයව ගනුදෙනුකරුගේ AFC ඉතුරුම් ගිණුමට, බැංකු ගිණුම්වලට, මුදල්, චෙක්පතකට හෝ ස්පීඩ් කෑෂ් ණය පොලී අයකර ගැනීමට මාරු කළ හැකිය.<br>8. සේවාව අවශ්‍ය වූ තැන්පත්කරුවන් සඳහා පුද්ගලාරෝපිත පාරිභෝගික සේවාව සහ දොරකඩ සේවාව.<br>9. ඒකාබද්ධ ගිණුම් හිමියන්ගෙන් එක් අයෙකු හෝ වැඩි දෙනෙකු මිය ගියහොත්, මූල්‍ය සමාගම, ජීවත්ව සිටින ගිණුම් හිමියාට/හිමියන්ට අදාල මුදල් ගෙවිය යුතුය.<br>10. තැන්පතු සහතිකය හුවමාරු කළ නොහැක. කෙසේ වෙතත්, තැන්පත්කරු/තැන්පත්කරුවන් හෝ ඔහුගේ/ඇයගේ/ඔවුන්ගේ නියෝජිත උරුමක්කාරයන්, විධායකයින් හෝ නාමිකයින්ට තැන්පතු අයදුම්පතේ ඇති ඕනෑම නිශ්චිත උපදෙස් වලට යටත්ව කල්පිරීමේදී එය මුදවා ගැනීමට අයිතියක් ඇත.<br>11. ස්ථාවර තැන්පතු සඳහා වන පොලිය පවතින බදු රෙගුලාසි වලට යටත් වේ. සමාගම්/වෙනත් ආයතන විසින් උපයන පොලී ආදායම ආදායම් බද්දට සහ වෙනත් ඕනෑම රජයේ බදු වලටද යටත් විය හැකිය. | **<u>ඒක පුද්ගල</u>**<br>1. නිසි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද ස්ථාවර තැන්පතු අයදුම්පත<br>2. නිසි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද KYC පෝරමය<br>3. ජාහැප / රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය / ජ්‍යෙෂ්ඨ පුරවැසි හැඳුනුම්පත<br>4. පාරිභෝගිකයා ද්විත්ව පුරවැසියෙකු නම්, ද්විත්ව පුරවැසි සහතිකය ලබා දීම අවශ්‍ය වේ.<br>5. AIT ප්‍රකාශය (අදාළ නම්)<br>-(පොළිය පිළිබඳ AIT ප්‍රකාශය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නවතම චක්‍රලේඛය මත පදනම් වේ).<br>6. නවතම බිල්පත් සාක්ෂි (මාස 03 ක කාලයක් ඇතුළත)<br>- ජාතික හැඳුනුම්පතේ හෝ රියදුරු බලපත්‍රයේ ලිපිනය නේවාසික ලිපිනයෙන් වෙනස් වන්නේ නම්, සියලුම ගනුදෙනුකරුවන් ලිපිනය සත්‍යාපනය සඳහා ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය<br><br>**<u>තනි හිමිකාරත්වය/ හවුල්කාරිත්වය/ සංස්ථා/ සීමිත වගකීම් සමාගම</u>**<br>1. නිසි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද ස්ථාවර තැන්පතු අයදුම්පත<br>2. නිසි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද KYC පෝරමය<br>3. ව්‍යාපාර ලියාපදිංචිය<br>4. බලයලත් අත්සන්කරුවන්ගේ අත්සන් සනාථ කරන ලිපිය<br>5. ආකෘති අංක 20, 40 හෝ 1, සහ 15<br>6. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය<br>7. KYC පෝරමය/ය (ප්‍රතිලාභදායක හිමිකරුවන් / සහ අධ්‍යක්ෂවරුන් සඳහා)<br>8. "අධ්‍යක්ෂවරුන්ගේ" ජාහැප පිටපත්<br>9. අවසාන ප්‍රතිලාභ හිමිකාරිත්ව පෝරමය<br>10. සමාගම් ව්‍යවස්ථාව<br><br>**<u>සමාජ, සමිති, පුණ්‍යායතන, සංගම් සහ රාජ්‍ය නොවන සංවිධාන</u>**<br>1. නිසි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද ස්ථාවර තැන්පතු අයදුම්පත<br>2. නිසි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද KYC පෝරමය<br>3. ලියාපදිංචි සහතිකයේ පිටපත<br>4. බලයලත් අත්සන්කරුවන්ගේ ලිපිය සහ | 1. තැන්පත්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු හෝ වලංගු හැඳුනුම්පතක් දරන, නේවාසික වීසා බලපත්‍රලාභියෙකු විය යුතුය.<br>2. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යන්නෙන් අදහස් කරන්නේ තැන්පතුව භාර ගන්නා විට හෝ තැන්පතුවක් අලුත් කරන විට වයස අවුරුදු 60 ඉක්මවූ සහ මාස 12 හෝ ඊට වැඩි තැන්පතු කාලයක් සඳහා අමතර 0.5% වාර්ෂික පොලියක් සඳහා හිමිකම් ඇති පුද්ගලයෙකි.<br>බද්ධ තැන්පතු සඳහා, ජ්‍යෙෂ්ඨ පුරවැසි අනුපාතය වැඩි කිරීමට නම් සියලුම ගිණුම් හිමියන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විය යුතුය.<br>3. වලංගු ලියාපදිංචි ලේඛනයක් ඇති ශ්‍රී ලංකාවේ ඕනෑම ලියාපදිංචි ආයතනයක්.<br>4. අලුත් කිරීමේ දැන්වීම ගිණුම් හිමියාට විද්‍යුත් තැපෑලෙන් / තැපෑලෙන් සහ කෙටි පණිවුඩයක් මගින් යවනු ලැබේ.<br>5. සියලුම මුදල් ආපසු ගැනීම් කරනු ලබන්නේ නිසි ලෙස අනුමත කරන ලද මුල් ස්ථාවර තැන්පතු සහතිකය සහ පාස්පොතේ / බැංකු ප්‍රකාශයේ පිටපතක් සමඟ සමාගමට ඉදිරිපත් කිරීමෙනි.<br>6. වීසා ලිපි / ශේෂය තහවුරු කිරීමේ ලිපි සහ බදු සහතික ගිණුම් හිමියන්ගේ ඉල්ලීම පරිදි නිකුත් කරනු ලැබේ.<br>7. මුල් ස්ථාවර තැන්පතු අයදුම්පතෙහි පත් කරන ලද නාමිකයාට සිදුවන ඕනෑම වෙනසක් සංශෝධනය කළ හැක්කේ ගිණුම් හිමියාගෙන් ලිඛිත උපදෙස් ලැබීමෙන් පසුව පමණි.<br>8. කල්පිරීමේ දිනයේදී හෝ ඊට පෙර තැන්පතුව අලුත් කිරීමේ නියමයන් සම්බන්ධයෙන් කිසියම් වෙනසක් සමාගමට දැනුම් නොදුනහොත්, එවැනි තැන්පතු පැවති කාලපරිච්ඡේදය සඳහාම අලුත් කරනු ලබන්නේ, එම අලුත් කිරීමේදී පවතින නියමයන් සහ කොන්දේසි වලට යටත්ව, පවතින පොලී අනුපාතවලට යටත්ව ය. උපචිත පොලිය සඳහා පෙර උපදෙස් අනුගමනය කරනු ලැබේ. අලුත් කිරීමේ දැනුම්දීමක් ස්වයංක්‍රීයව | • තොරතුරු ප්‍රධාන කාර්යාලයෙන්, ළඟම ඇති ශාඛාවෙන්, ඇමතුම් මධ්‍යස්ථානයෙන් (1321) හෝ සමාගමේ වෙබ් අඩවියෙන් www.alliancefinance.lk වෙතින් ලබා ගත හැක.<br>• කෙටි පණිවුඩ සේවාව සඳහා ගාස්තු අය නොකෙරේ.<br>• වීසා ලිපි/ශේෂ තහවුරු කිරීම සහ බදු සහතික සඳහා ගාස්තු අය නොකෙරේ.<br>• ස්ථාවර තැන්පතු සහතිකය නැතිවීම සඳහා නව ස්ථාවර තැන්පතු සහතිකය නිකුත් කිරීමේදී ඒ සඳහා ගාස්තු අය නොකෙරේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | ජාතික හැඳුනුම්පත්වල පිටපත<br>5. කමිටු හෝ මණ්ඩල යෝජනාව<br>6. KYC පෝරම/ය (ප්‍රතිලාභ හිමිකරු/නිලධාරීන් සහ අධ්‍යක්ෂවරුන් සඳහා)<br>7. භාරකාර ඔප්පුව<br>8. අවසාන ප්‍රතිලාභ හිමිකාරිත්ව පෝරමය<br>9. අවශ්‍ය නම්, ඇටෝර්නි බලපත්‍රයේ හෝ මණ්ඩල/කමිටු යෝජනාවේ පිටපත<br>10. සමාගම් ව්‍යවස්ථාව<br>11. තනි ගිණුම් සම්බන්ධයෙන් නම් ආයතනයේ මෙහෙයුම් කෙරෙහි පාලනය සහ බලපෑම ඇති නිලධාරීන් දෙදෙනෙකු අවම වශයෙන්, අත්සන්කරුවන්, පරිපාලකයින්, පාලක මණ්ඩලයේ හෝ කමිටුවේ සාමාජිකයින් හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු හඳුනා ගැනීම<br><br>**විදේශීය පුරවැසියෙක් නම්**<br><br>1. වලංගු වීසා දිගුවක් සහිත වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්<br>2. ශ්‍රී ලාංකික පදිංචිය පිළිබඳ බිල්පත් සාක්ෂි | පාරිභෝගිකයා වෙත යවනු ලැබේ.<br>9. සහතිකයක් නැති වුවහොත්, ගිණුම් හිමියාගෙන් පැහැදිලි සහ නිසි ලෙස සම්පූර්ණ කරන ලද වන්දිපූරණ පෝරමයක් අයදුම්පත සමඟ ලැබුණු පසු නව සහතිකයක් නිකුත් කරනු ලැබේ. (ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු විසින් හෝ නීතිඥයෙකු විසින් හෝ සහතික කල යුතුය.).<br>10. වෙනත් නියමයන් සහ කොන්දේසි සඳහා කරුණාකර තැන්පතු අයදුම්පතේ පිටුපස බලන්න. සියලුම නියමයන් සහ කොන්දේසි පූර්ව ගිවිසුම් අවධියේදී සන්නිවේදනය කෙරේ. | |

| | | | | |
|---|---|---|---|---|
| **කල් පිරීමට පෙර මුදල් ආපසු ගැනීම්** | 1. කල් පිරීමට පෙර මුදල් ආපසු ගැනීම් කළ හැකි අතර සියලුම හිමිකරුවන්ගේ අත්සන් අවශ්‍ය වේ.<br>2. කල්පිරීමේ දිනයට පෙර ලබාගන්නා මුදල් ආපසු ගැනීම් පොලි අනුපාත ගැලපීමකට යටත් වේ. | 1. තැන්පතු හිමියා/හිමියන් විසින් නිසි ලෙස අත්සන් කර නිකුත් කරන ලද මුල් ස්ථාවර තැන්පතු සහතිකය<br>2. අරමුදල් ප්‍රේෂණය කරනු ලබන බැංකු පොතේ/බැංකු ප්‍රකාශයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය. | 1. මුදල් කල්තියා ආපසු ගැනීමකදී, ගෙවිය යුතු පොලිය අඩු අනුපාතයක් මත පදනම්ව ගණනය කරනු ලැබේ. මාසික පොලී ගෙවන තැන්පතු සම්බන්ධයෙන්, වැඩිපුර ගෙවන ලද ඕනෑම පොලියක් තැන්පතු ප්‍රාග්ධනයෙන් අයකර ගනු ලැබේ.<br>2. ස්ථාපනය කිරීමට දින 30 කට පෙර ස්ථාවර තැන්පතුව ආපසු ලබා ගන්නේ නම් (ස්ථාපනය කළ දිනය ඇතුළුව සහ මුදල් ආපසු ගත් දිනය හැර), තැන්පත්කරුට කිසිදු පොලියක් ගෙවනු නොලැබේ | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව දඩ අනුපාත තීරණය කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| **තැන්පතු රක්ෂණ ආවරණය** | සුදුසුකම් ලත් තැන්පතු වගකීම් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ තැන්පත්කරුවෙකුට රු. 1,100,000/- දක්වා රක්ෂණය කර ඇත. | සමාගමේ ක්‍රියාකාරී තැන්පතු | රක්ෂණ වාරිකය සමාගම විසින් දරනු ලැබේ. | සේවාදායකයාගෙන් කිසිදු ගාස්තුවක් අය නොකෙරේ. |
| **අක්‍රිය ගිණුම් සහ අතහැර දැමූ තැන්පතු සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි** | 1. තැන්පතුකරු/ ඇටෝර්නි බලකරු සමාගම සමඟ තැන්පතු/ මුදල් ආපසු ගැනීම මගින් ගනුදෙනු කර නොමැති විට/ වසර 10 කට වැඩි කාලයක් කිසිදු ලිපි හුවමාරුවක් සිදු කර නොමැති විට තැන්පතුවක් අක්‍රිය වේ.<br>2. වසර 10 කට වැඩි කාලයක් පොලී ගෙවීම් හැර වෙනත් ගනුදෙනු නොමැති තැන්පතු අක්‍රිය ගිණුමට මාරු කරනු ලැබේ. | මුල් ස්ථාවර තැන්පතු අයදුම්පත, KYC, ජාතික හැඳුනුම්පතේ පිටපත/ බිල්පත් සාක්ෂි සහ ස්ථාවර තැන්පතු ගොනුවේ අනෙකුත් අදාළ ලියකියවිලි. | අක්‍රිය / අතහැර දැමූ තැන්පතු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති සම්මත නීතිමය ක්‍රියා පටිපාටිය අනුගමනය කරනු ඇත. ගනුදෙනුවක් නොමැති (පොළී ගෙවීම් හැර) හෝ ලිපි හුවමාරුවක් නොමැතිව උපරිම වසර 10 ක කාලයක් සඳහා තැන්පතු අක්‍රිය ලෙස සලකුණු කර පසුව 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවට වාර්තා කරනු ලැබේ. KYC පෝරමය සමඟ අක්‍රිය බවින් නිදහස් කිරීමේ අයදුම්පත ලැබීමෙන් පසු අක්‍රිය බවින් නිදහස් කරනු ලැබේ. | ගාස්තු අය නොකෙරේ. |
| **තැන්පතු සඳහා ණය (ස්පීඩ් කෑෂ් ණය)** | 1. එය තැන්පත්කරුවන්ට ඕනෑම හදිසි අවශ්‍යතාවයක් සඳහා අවශ්‍ය විටෙක ස්ථාවර තැන්පතු සහතික ඇපයට තබා ස්ථාවර තැන්පතුවට එරෙහිව ණය ලබා ගැනීමට හැකියාව ලබා දෙයි.<br>2. 75% - 90% ණය මුදලක් අනුමැතිය මත ලබා දෙනු ලැබේ.<br>3. ණය පොලිය දිනපතා ගණනය කරනු ලබන අතර ශේෂය අඩු කිරීමේ ක්‍රමය මත පොලී අයකර ගනු ලැබේ.<br>4. කරදරයකින් තොර ලියකියවිලි.<br>5. නිසි ලියකියවිලි සමඟ ගනුදෙනුකරු | 1. නිසි ලෙස අනුමත කරන ලද මුල් ස්ථාවර තැන්පතු සහතිකය.<br>2. ස්පීඩ් කෑෂ් ණය අයදුම්පත/ හිලව් කිරීමේ ලිපිය/ ණය ගිවිසුම සම්පූර්ණ කිරීම.<br>3. ජාතික හැඳුනුම්පත / රියදුරු බලපත්‍රය/ විදේශ ගමන් බලපත්‍රය | 1. ණය සම්පූර්ණයෙන් පියවන තුරු නාමිකයා අවලංගු කෙරේ.<br>2. ණය පොලිය තැන්පතුවල මාසික පොලියෙන් අයකර ගනු ලබන අතර කල්පිරීමේ ගිණුම් හිමියන් අදාළ නියමිත දිනට මාසිකව තම ණය පොලිය ගෙවිය යුතුය.<br>• **ස්ථාවර තැන්පතු කල්පිරීමෙන් පසුව පවා පාරිභෝගිකයා ණය ශේෂය දිගටම කරගෙන යාමට කැමති නම්, ස්පීඩ් කෑෂ් ණය පියවා නැවත පවතින පොලී අනුපාත යටතේ** | • **ණය අනුපාතය** = ස්ථාවර තැන්පතු අනුපාතය + 4% අවම අනුපාතය කළමනාකාරිත්වයේ අභිමතය පරිදි වේ.<br><br>• ණය මුදල රු. මිලියන 1 ට අඩු නම් රු. 500 ක් සහ ණය මුදල රු. මිලියන 1 හෝ ඊට වැඩි නම් රු. 1,000 ක් **ලේඛන ගාස්තු අය කෙරේ.** |

| | | | | |
|---|---|---|---|---|
| | පැමිණීමෙන් පැය 1 ක් ඇතුළත ණය ලබා දිය හැකිය.<br>6. ණය පොලිය සහ ප්‍රාග්ධනය පියවීම සඳහා ස්ථාවර තැන්පතු සඳහා ලැබෙන පොළිය ස්වයංක්‍රීයව ඔබගේ ස්පීඩ් කෑෂ් ණය පහසුකමට මාරු කළ හැකිය. | | **විවෘත කරනු ලබන අතර, ගෙවා අවසන් කල යුතු ඕනෑම ණය පොලියක් සම්පූර්ණයෙන්ම පියවා දැමිය යුතුය.** | *සියලු ගාස්තු කළමනාකාරිත්වයේ අභිමතය පරිදි වරින් වර වෙනස් වන බව කරුණාවෙන් සලකන්න. |

| | | | | |
|---|---|---|---|---|
| **ඉතිරි කිරීමේ ගිණුම් විවෘත කිරීම** | 1. බාලවයස්කරුවන් / තනි පුද්ගල / ඒකාබද්ධ / ආයතනික ගනුදෙනුකරුවන් සඳහා සුදුසුය.<br>2. පොලිය දිනපතා ගණනය කර මාසිකව ගිණුමට බැර කරනු ලැබේ.<br>3. පොලී අනුපාත අඩු කිරීමකින් තොරව මසකට ඕනෑ තරම් තැන්පතු / මුදල් ආපසු ගැනීම්.<br>4. ස්ථාවර නියෝග පහසුකම.<br>5. පහසු මුදල් තැන්පතු / CEFT මාරු කිරීම් / මුදල් ආපසු ගැනීම් සහ අරමුදල් මාරු කිරීම්.<br>6. සුදුසුකම් ලත් තැන්පතු වගකීම්, මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය සමඟ රක්ෂණය කර ඇති අතර, එක් තැන්පත්කරුවෙකුට උපරිම වශයෙන් රු. 1,100,000/- දක්වා වන්දි ලබා දෙනු ලැබේ.<br>7. ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය, රියදුරු බලපත්‍රය ඉදිරිපත් කිරීමෙන් මුදල් ආපසු ගැනීම් කළ හැකිය. නිවැරදිව සම්පූර්ණ කරන ලද මුදල් ආපසු ගැනීමේ පෝරමය සහ ඉතුරුම් පාස්පොත ඉදිරිපත් කළ යුතුය. | **සාමාන්‍ය පුද්ගල**<br>1. ඒක පුද්ගල<br>2. නිසි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද ඉතිරි කිරීමේ ගිණුම් අයදුම්පත<br>3. නිසි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද KYC පෝරමය<br>4. ජාහැප / රියදුරු බලපත්‍රය / විදේශ ගමන් බලපත්‍රය / ජ්‍යෙෂ්ඨ පුරවැසි හැඳුනුම්පත<br>5. පාරිභෝගිකයා ද්විත්ව පුරවැසියෙකු නම්, ද්විත්ව පුරවැසි සහතිකය ලබා දීම අවශ්‍ය වේ.<br>6. AIT ප්‍රකාශනය (අදාළ නම්)<br>• (පොළිය සඳහා AIT ප්‍රකාශනය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නවතම චක්‍රලේඛය මත පදනම් වේ).<br>7. නවතම බිල්පත් සාක්ෂි (මාස 03 ක කාලයක් ඇතුළත)<br>• පදිංචි ලිපිනය ජාතික හැඳුනුම්පතේ හෝ රියදුරු බලපත්‍රයේ සඳහන් ලිපිනයට වෙනස් නම්, සියලුම ගනුදෙනුකරුවන් ලිපිනය සත්‍යාපනය සඳහා ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.<br><br>**තනි හිමිකාරිත්වය/ හවුල්කාරිත්වය/ සංස්ථා/ සීමිත වගකීම් සමාගම**<br>1. නිසි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද ඉතිරි කිරීමේ ගිණුම් අයදුම්පත<br>2. නිසි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද KYC පෝරමය<br>3. ව්‍යාපාර ලියාපදිංචිය<br>4. බලයලත් අත්සන්කරුවන්ගේ ලිපිය<br>5. ආකෘති පත්‍ර 20, 40 හෝ 1, සහ 15<br>6. මණ්ඩල යෝජනාව<br>7. KYC පෝරමය/ය (ප්‍රතිලාභදායක හිමිකරුවන් / සහ අධ්‍යක්ෂවරුන් සඳහා)<br>8. "අධ්‍යක්ෂවරුන්ගේ" ජාහැප පිටපත්<br>9. අවසාන ප්‍රතිලාභ හිමිකාරිත්ව පෝරමය<br>10. සමාගම් ව්‍යවස්ථාව | 1. වලංගු හැඳුනුම්පතක් සහිත වයස අවුරුදු 18ට වැඩි ශ්‍රී ලංකාවේ ඕනෑම පුරවැසියෙකු,<br>2. වලංගු ලියාපදිංචි ලේඛනයක් ඇති ශ්‍රී ලංකාවේ ඕනෑම ලියාපදිංචි ආයතනයක්.<br>3. සාමාන්‍ය ඉතුරුම් ගිණුම් සඳහා ආරම්භක ගිණුම් විවෘත කිරීමේ තැන්පතුව රු. 500/- කි.<br>4. බාලවයස්කාර ඉතුරුම් ගිණුම් සඳහා ආරම්භක ගිණුම් විවෘත කිරීමේ තැන්පතුව රු. 1000/- කි.<br>5. ගිණුමක පවත්වා ගත යුතු අවම මුදල රු. 500/- කි. එසේ නොවේ නම් ගිණුමෙන් රු. 50/- ක් අඩු කරනු ලැබේ.<br>6. පාස්පොත නැති වුවහොත්, ගිණුම් හිමියාගෙන් සතුටුදායක පැහැදිලි කිරීමක් (ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ නීතිඥයෙකු විසින් සහතික කරන ලද) සහ නිසි ලෙස සම්පූර්ණ කරන ලද වන්දිපූරණ පෝරමයක් ලැබුණු පසු නව පාස්පොතක් නිකුත් කරනු ලැබේ.<br>7. වෙනත් නියමයන් සහ කොන්දේසි සඳහා කරුණාකර ඉතුරුම් අයදුම්පතේ පිටුපස බලන්න.<br>8. බාලවයස්කරුට වයස අවුරුදු 18 සම්පූර්ණ වන තුරු මුදල් ආපසු ගැනීම් සඳහා අවසර දෙනු නොලැබේ.<br>9. බාලවයස්කාර ගිණුම් හිමියන්ගේ අධ්‍යාපනය සහ වෛද්‍ය කටයුතු වැනි අත්‍යවශ්‍ය අවශ්‍යතා සඳහා පමණක්, භාරකරු විසින් ඉදිරිපත් කරන ලද වලංගු ලියකියවිලි මත පදනම්ව, මුදල් ආපසු ගැනීම් සඳහා පමණක් අවසර දෙනු ලැබේ.<br>10. වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු, බාලවයස්කරුට අරමුදල් ආපසු ලබා ගත හැකිය, නැතහොත් සුදුසු පරිදි සාමාන්‍ය ඉතුරුම් ගිණුමකට | 1. නවතම පොලී අනුපාත සඳහා කරුණාකර AFC වෙබ් අඩවියට පිවිසෙන්න. www.alliancefinance.lk<br>2. ගිණුම් විවෘත කිරීම, නඩත්තු කිරීම සහ වසා දැමීමේ ගාස්තු නොමැත.<br>3. ස්ථාවර නියෝග පහසුකම් සඳහා ගාස්තු නොමැත.<br>4. ගනුදෙනුකරුට නොමිලේ පාස්පොත නිකුත් කෙරේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | <u>**සමාජ, සමිති, පුණ්‍යායතන, සංගම් සහ රාජ්‍ය නොවන සංවිධාන**</u><br>1. නිසි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද ඉතිරි කිරීමේ ගිණුම් අයදුම්පත.<br>2. නිසි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද KYC පෝරමය.<br>3. ලියාපදිංචි කිරීමේ පිටපත.<br>4. බලයලත් අත්සන්කරුවන්ගේ ලිපිය සහ ජාතික හැඳුනුම්පත්වල පිටපතක්.<br>5. කමිටු හෝ මණ්ඩල යෝජනාව<br>6. KYC පෝරමය/ය (වාසිදායක හිමිකරු/නිලධාරීන් සහ අධ්‍යක්ෂවරුන් සඳහා)<br>7. භාර ඔප්පුව<br>8. අවසාන ප්‍රතිලාභ හිමිකාරිත්ව පෝරමය<br>9. අවශ්‍ය නම්, ඇටෝර්නි බලයේ හෝ මණ්ඩල/කමිටු යෝජනාවේ පිටපතක්<br>10. සමාගම් ව්‍යවස්ථාව<br>11. තනි පුද්ගල ගිණුම් සම්බන්ධයෙන් නම් ආයතනයේ මෙහෙයුම් කෙරෙහි පාලනය සහ බලපෑම ඇති නිලධාරීන් දෙදෙනෙකු අවම වශයෙන්, අත්සන්කරුවන්, පරිපාලකයින්, පාලක මණ්ඩලයේ හෝ කමිටුවේ සාමාජිකයින් හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකුගේ හඳුනා ගැනීමක් ඉදිරිපත් කළ යුතුය.<br><br>**විදේශ පුරවැසියෙක් නම්**<br>වලංගු වීසා දිගුවක් සහිත වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්<br>ශ්‍රී ලාංකික පදිංචිය පිළිබඳ බිල්පත් සාක්ෂි<br><br>**බාල වයස්කරුවෙක් නම්**<br>1. භාරකරු හෝ දෙමාපියන් විසින් අත්සන් කරන ලද නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත.<br>2. KYC (දෙමව්පියන් හෝ නීත්‍යානුකූලව පත් කරන ලද භාරකරු විසින් ඉදිරිපත් කළ යුතුය)<br>3. උප්පැන්න සහතිකයේ පිටපත<br>4. දෙමාපියන්ගේ/භාරකරුගේ ජාතික හැඳුනුම්පතේ/ රියදුරු බලපත්‍රයේ/ විදේශ ගමන් බලපත්‍රයේ පිටපත<br>5. AIT ප්‍රකාශය (අදාළ නම්)<br>6. නවතම බිල්පත් සාක්ෂි (මාස 03ක් ඇතුළත) | පරිවර්තනය කිරීම සඳහා තනි ඉතුරුම් අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.<br>• <u>**අක්‍රිය ගිණුම් ප්‍රතිපත්තිය**</u><br>1. අක්‍රිය / අතහැර දැමූ ඉතුරුම් ගිණුම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති සම්මත නීතිමය ක්‍රියා පටිපාටිය අනුගමනය කරනු ඇත.<br><br>2. අක්‍රිය / අතහැර දැමූ ඉතුරුම් ගිණුම්වල අඛණ්ඩව වසර 10 ක් හෝ ඊට වැඩි කාලයක් ගිණුම් හිමියන්ගෙන් කිසිදු මූල්‍ය ක්‍රියාකාරකමක් (ඉවත් කිරීමක් හෝ ඉතුරුම් තැන්පතුවක්) නොමැති නම්, එම ගිණුම් “අක්‍රිය ගිණුමක්” ලෙස වර්ගීකරණය සලකනු ලබන අතර, 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවට වාර්තා කරනු ලැබේ.<br><br>3. බාලවයස්කාර ඉතුරුම් ගිණුම් සඳහා, ගිණුම සාමාන්‍ය ඉතුරුම් (වැඩිහිටි) ගිණුමක් බවට පරිවර්තනය කිරීමෙන් පසු අක්‍රිය ගිණුම් ප්‍රතිපත්තිය අදාළ වේ. | |

ප්‍රධාන කරුණු ලේඛනයේ එලයන්ස් ෆිනෑන්ස් සමාගම විසින් පිරිනමනු ලබන තැන්පතු/ ඉතුරුම් ගිණුම් සහ සේවාවන්හි ප්‍රධාන ලක්ෂණ අඩංගු වේ. ඉහත සඳහන් ඕනෑම නියමයන්, කොන්දේසි සහ ගාස්තු ඕනෑම අවස්ථාවක සංශෝධනය කිරීමේ අයිතිය සමාගම සතුය.

## පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටි.

සමාගම විසින් පිරිනමනු ලබන සේවාව පිළිබඳව සෑහීමකට පත් නොවන ගනුදෙනුකරුවන්ට, පහත සඳහන් මාර්ග හරහා අපගේ සේවාවන් සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කළ හැකිය,

- අදාළ ශාඛාවල ශාඛා කළමනාකරු වෙත යොමු කරන ලද ලිපියකින් (සම්බන්ධ කරගත හැකි තොරතුරු අපගේ වෙබ් අඩවිය වන www.alliancefinance.lk හි ලැයිස්තුගත කර ඇත).
- පාරිභෝගික පැමිණිලි හැසිරවීමේ නිලධාරියා, අංක 84, වෝඩ් පෙදෙස, කොළඹ -7 වෙත යොමු කරන ලද ලිපියකින්.
- 0777761861 හෝ පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංකය: 112 673673 (දිගුව-195) හරහා අපගේ පාරිභෝගික පැමිණිලි හැසිරවීමේ නිලධාරියා සමග සම්බන්ධ වන්න.
- info@alliancefinance.lk වෙත යවනු ලබන ලිපියක් හෝ විද්‍යුත් තැපෑලක් මගින්.

AFC ඔබගේ පැමිණිල්ල පිළිගෙන පැමිණිල්ල පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් සිදු කරනු ඇත. - AFC විසින් ගනුදෙනුකරු අමතා වැඩ කරන දින 7ක් ඇතුළත ප්‍රතිඵලය / තීරණය පිළිබඳ විස්තර ලබා දිය යුතුය.

සමාගම විසින් සතුටුදායක විසඳුමක් ලබා නොදුනහොත්, ගනුදෙනුකරුට තම පැමිණිල්ල ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් වෙත යොමු කළ හැකිය.

**මූල්‍ය ඔම්බුඩ්ස්මන්,**
**143/A, වජිර පාර, කොළඹ 05**
**දුරකථන: 0112595624/0112595625**

විද්‍යුත් තැපෑල - fosril@sltnet.lk
වෙබ් අඩවිය - www.financialombudsman.lk

**ශ්‍රී ලංකා මහ බැංකුව - මූල්‍ය පාරිභෝගික**
**සබඳතා දෙපාර්තමේන්තුව (FCRD)**

අධ්‍යක්ෂ
මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව (FCRD)
ශ්‍රී ලංකා මහ බැංකුව
30, ජනාධිපති මාවත, කොළඹ 01.

PEOPLE • PLANET • PROFIT
Sri Lanka's pioneering triple bottom line financial institution